# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1189/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/07/2024 පැය 1215

**මාධ්‍ය නිවේදනය**

**දෙවිනුවර ශ්‍රී විශ්නු මහා දේවාලයේ ඇසළ පෙරහර 2024 - රථවාහන ගමනාගමනය සීමා කිරීම - ගන්දර පොලිස් වසම.**

ගන්දර පොලිස් වසමේ දෙවිනුවර ශ්‍රී විශ්නු මහා දේවාලයේ ''767 වන ඇසළ පෙරහර මංගල්‍යය'' 2024.07.06 වන දින කප් සිටුවීමෙන් අනතුරුව 2024.07.14 වන දින සිට 2024.07.19 වන දින දක්වා පේළි පෙරහර පවත්වා ඉන් අනතුරුව 2024.07.20 වන දින අවසන් රන්දෝලි මහා පෙරහැර පැවැත්වීමටත් කටයුතු සංවිධානය කර ඇත

පෙරහර නැරඹීම සඳහා විශාල බැතිමතුන් සංඛ්‍යාවකගේ පැමිණීම අපේක්ෂා කරන බැවින් පැමිණෙන මහජනතාවට මෙන්ම පෙරහරට බාධාවකින් තොරව ගමන් කිරීම සඳහා විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කර ඇත.

- **පැවැත්වෙන දිනය - 2024.07.19 වන අද දින සහ 2024.07.20 යන දෙදින**
- **රථවාහන ගමනාගමන සීමා කරනු ලබන වේලාව - පස්වරු 02.00 සිට පස්වරු 06.00 දක්වා**

මෙම පෙරහර, මාතර කතරගම ප්‍රධාන මාර්ගයේ මැද්දවත්ත කාර්මික විද්‍යාල හන්දිය සහ තලල්ල දකුණ මහා විද්‍යාලය අසලින් ගමන් කරන බැවින් තාවකාලිකව රථ වාහන ගමනාගමනය සීමා කර ඇති අතර ඉහත කාල සීමාව තුල පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කරන මෙන් පොලිසිය මහජනතාවගෙන්ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග**

- තංගල්ල, කතරගම දෙස සිට මාතර දෙසට ධාවනය වන සියළුම රථවාහන, යතුරුපැදි තලල්ල කාර්මික විද්‍යාලය අසලින් දකුණට ඇති නාඹටුන්න මාර්ගයේ ගමන් කර වියන්නරුව හන්දියේ සිට කැකනදුර රත්මලේ මාර්ගයෙන් කැකනදුර දෙසට ධාවනය කර එතැන් සිට කැකැනදුර හන්දියෙන් මාතර කැකනදුර මාර්ගයේ මැද්දවත්ත හන්දියට ධාවනය කර මාතර දෙසට ගමන් කළ හැකිය.

- මාතර දෙස සිට තංගල්ල, කතරගම දෙසට ධාවනය වන සියළුම රථ වාහන, යතුරුපැදි මාතර දෙස සිට කැකනදුර මාර්ගයේ ධාවනය කර කැකනදුර හන්දියෙන් රත්මලේ කැකනදුර මාර්ගයේ ගමන් කර දික්වැල්ල නගරයෙන් කතරගම දෙසට ධාවනය කළ හැකිය. තවද තංගල්ල දෙස සිට ගන්දර දක්වා ධාවනය වන සියළුම රථ වාහන දෙවිනුවර ඉන්ධන පිරවුම් හල දක්වා ධාවනය කළ හැකිය .

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**